# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No — 10120

ෆැක්ස්<br>தொலைநகல<br>Fax — 011-2171635

දුරකථන<br>தொலைபேசி<br>Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site — www.Police.lk

ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail — dir.media@police.gov.lk


මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO — 1452/ 2024

ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No — / 2024

දිනය<br>திக<br>Date — 10/09/2024 පැය 1555

## මාධ්‍ය නිවේදනය

### 01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන ඒකකය.

2024.09.09 වන දින රාත්‍රී කාලයේදී, මහරගම පොලිස් වසමේ 2 වන පටුමග ප්‍රදේශයේදී මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 13 මිලි ග්‍රෑම් 600 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන මහරගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීන් විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. බඹර ප්‍රහාරයක් හේතුවෙන් පුද්ගලයකු මිය යාම - පන්විල පොලිස් වසම

2024.09.10 වන අද දින උදෑසන කාලයේ පන්විල පොලිස් වසමේ හාගල රාජ්‍ය වතුයායට අයත් අංක 04 මලෙයි කොටසේ වතුකම්කරු රැකියාව කරමින් සිටි පිරිසකට එල්ල වූ බඹර ප්‍රහාරයක් සම්බන්ධයෙන් පන්විල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් විමර්ශන ආරම්භ කර ඇත. මෙම බඹර හේතුවෙන් තුවාල ලැබූ පුද්ගලයින් දෙදෙනෙකු සහ කාන්තාවක් ප්‍රතිකාර සඳහා මඩුල්කැලේ ප්‍රාදේශීය රෝහල වෙත ඇතුලත් කිරීමේදී එක් පුද්ගලයකු මිය ගොස් ඇති අතර අනෙක් පුද්ගලයා සහ කාන්තාව නේවාසිකව ප්‍රතිකාර ලබයි.

**මරණකරු වයස අවුරුදු 55 ක්වූ තවලන්තැන්න ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

පන්විල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**03. විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොටදෙනියාව පොලිස් ස්ථානය.**

2024.09.10 වන දින දහවල් කාලයේ කොටදෙනියාව පොලිස් වසමේ කළුඅග්ගල ප්‍රදේශයේදී බස්නාහිර පළාත් උතුර විශේෂ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන කළුඅග්ගල, මීරිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

කොටදෙනියාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**